**නොච්චියාගම ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**-----------------------------------**

**01. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-----------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 06 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 23 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 31 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
----------------------------------------

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු කල්බදු රු.292,790 ක් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. තවද කල්බදු වාරික ගෙවීම් රු.127,893 ක් සහ කල්බදු පොලී ගෙවීම් රු.37,597 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) ටෙන්ඩර් ආදායම් ලේඛනය අනුව මස්,මාළු සහ සතිපොල වශයෙන් වෙළඳ ස්ථාන 05 කින් 1992 වර්ෂයේ සිට 1994 වර්ෂය දක්වා අයවියයුතු රු.51,444 ක මුදල මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණු එකතුව රු.6,114,210 ක් වූ කාර්යාල උපකරණ සම්බන්ධයෙන් ගෙවියයුතු මුදල බැරකම් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඈ) සභාව විසින් ණය පදනම මත සමාලෝචිත වර්ෂයේදී ලබාගෙන තිබුණු රු.124,550 ක් වූ තිරරෙදි සහ බුමුතුරුණු වටිනාකම ගිණුම්ගතකර නොතිබුණි.

(ඉ) ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීමේ දෙවන අදියර සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිමකළ වැඩ වටිනාකම සහ ඒ වෙනුවෙන් ගෙවිය යුතු බැරකම රු.12,127,903 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) ප්‍රාදේශීය සභා භූමියේ ඉදිකර තිබුණු නව පුස්තකාල ගොඩනැගිල්ල, නගරශාලා ගොඩනැගිල්ල සහ කුසුම්පුර කසල ප්‍රතිචක්‍රීය කරන මධ්‍යස්ථාන යන ඉදිකිරීම්වල වටිනාකම් වත්කම් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

## 02. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් අතිරික්තය රු.3,442,277 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ලැබී තිබුණු මෙහෙයුම් ඌනතාවය රු.551,007 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

---------------------

#### 2.2.1 වරිපනම් බදු

---------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.3,643,571 ක් වූ හිඟ වරිපනම් බදු ආදායම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 දුරකථන සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු

--------------------------------------

සභා බලප්‍රදේශයේ ඉදිකර තිබුණු සම්ප්‍රේෂණ කුළුණු 04 කින් අයකළයුතු රු.396,656 ක්වූ ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.3 කඩකුලී

--------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කඩකුලී ආදායම රු.5,349,850 ක්වූ අතර, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 වගන්තිය ප්‍රකාර කටයුතු කර එම හිඟ මුදල් අයකර ගෙන නොතිබුණි.

#### 2.2.4 බදුකුලී

------

(i) ළිඳවැව මුහුදු මාළු ලැල්ල සමාලෝචිත වර්ෂය සඳහා රු.93,000 කට බදු දීම සඳහා තෝරාගෙන තිබුණු බදුකරු රු.31,000 ක් වූ තැන්පත් මුදලක් පමණක් ගෙවීම් කර ගිවිසුම් අත්සන් නොකරමින් සහ රු.62,000 ක හිඟ මුදල් නොගෙවමින් වෙනත් ස්ථානයක මුහුදු මාළු වෙළඳාම සිදු කරමින් තිබුණු අතර, මෙම අනවසර වෙළඳාම වැළැක්වීමට සභාව විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ii) 1988 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයේ සතිපොල, ගවමස් කඩ සහ මාළු වෙළඳසල් හිඟ බදු වශයෙන් එකතුව රු.877,015 ක් අයවිය යුතුව තිබු නමුත්, ගිවිසුම් ප්‍රකාර හිඟ මුදල් අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.එමෙන්ම රු.662,092 ක හිඟ මුදල් අයවිය යුතුව තිබුණු බදුකරුවන් 07 දෙනෙකු අසාධු ලේඛනගත කර නොතිබුණු අතර, පෙර වර්ෂවලදී අසාධු ලේඛනගත ටෙන්ඩර්කරුවන් දෙදෙනෙකුට පසු කාලපරිච්ඡේදවලදී බදුදීම් අවස්ථා නිරීක්ෂණය විය.

**2.2.5 ජල බදු**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ ජලබදු ආදායම රු.4,551,453 ක්වූ අතර,එම හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට විධිමත් පියවර අනුගමනය කර නොතිබුණි.

**2.2.6 නිවාස කුලී**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණු හිඟ නිවාස කුලිය රු.232,150 ක්වූ අතර එම මුදල් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

**03. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව විසින් එක්රැස් කර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට ප්‍රේෂණය කළයුතුව තිබෙන එකතුව රු.245,817 ක් වූ බදු ගිණුම් ශේෂ 02 ක් වර්ෂ 03 ක් ඉක්මවූ කාලපරිච්ඡේදයක සිට නිරවුල් කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) 2007 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ ප්‍රාදේශීය සභාවට ලැබී තිබුණු රු.11,876,212 ක් වූ වාහන/ඉඩම් වාහන 08 ක්, මෝටර් රථ පනතේ (203 වන අධිකාරිය) 2(1) වගන්තිය ප්‍රකාරව ලියාපදිංචි නොකර ධාවනයේ යොදවා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබුණු රු.908,422 ක පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක මුදල නිරවුල් කර නොතිබුණු අතර, මෙම මුදල වර්ෂ 10 ඉක්මවූ කාලපරිච්ඡේදයක සිට එකතු වෙමින් පැවති මුදලක් විය.

(ඈ) පහළහල්මිල්ලෑව ග්‍රාමනිලධාරී වසමේ ජල පෙරණ ව්‍යාපෘතියට අවසාන ගෙවීම් සිදු කරන අවස්ථාවේ සවි කර තිබුණු රු.376,500 ක් වටිනා ජල පිරිපහදු යන්ත්‍රය ගලවා ඉවත් කර වෙනත් ජල පිරිපහදු යන්ත්‍රයක් සවිකර තිබුණු අතර, එම යන්ත්‍රයේ වටිනාකම රු.283,500 ක් බව විගණනයේදී අනාවරණය විය.

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිපාදනය රු.9,891,470 ක් වූ සංවර්ධන ව්‍යාපෘති යෝජනා 53 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) පුරනැගුම ව්‍යාපෘතිය යටතේ මූල්‍ය ප්‍රතිපාදනය රු.50,000,000 ක් වූ ව්‍යාපෘති 11 ක් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) 2015 පළාත් නිශ්චිත සංවර්ධන වැඩසටහනට අදාළව අනුමත මූල්‍ය ප්‍රතිපාදනය රු.5,000,000 ක් වූ ව්‍යාපෘති 02 ක් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) රලපනාව ජනපදයේ තිසර ප්‍රජාමුල ජල ව්‍යාපෘතියට ජල පිරිපහදු යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා රු.990,000 ක් වූ ප්‍රතිපාදිත මුදලින් 2015 දෙසැම්බර් 31 දින වන විට රු.970,000 ක් ගෙවා තිබුණි. එහෙත් මෙම ව්‍යාපෘතියේ පානීය ජල ළිඳෙන් ටැංකියට ජලය ලබාගැනීමට වතුර මෝටරයක් නොතිබීමෙන් අදාළ ව්‍යාපෘතිය වෙනුවෙන් දරා තිබුණු මුළු පිරිවැය නිශ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි.

**3.3 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

------------------------------

(අ) පළාත් පාලන අමාත්‍යාංශ මූල්‍ය ආධාර යටතේ රු.5,816,818 කට ආසන්න වියදමකින් අඩි 45X105 ප්‍රමාණයේ කසල ප්‍රතිචක්‍රියකරණ ගොඩනැගිල්ලක් ඉදිකර වර්ෂ 03 ක් ඉක්මවූ කාලපරිච්ඡේදයක සිට කිසිදු ප්‍රයෝජනයකට ගෙන නොතිබුණි.

(ආ) ගොඩනැගිල්ලට පිවිසීම සඳහා විධිමත් ප්‍රවේශ මාර්ගයක් සකස් කර නොතිබුණු අතර, ජාතික විදුලිබල පද්ධතියෙන් විදුලිය ලබාගැනීමට රු.10,000,000 කට ආසන්න ඇස්තමේන්තුවක්ද සූර්ය කෝෂ විදුලිය සඳහා රු.4,460,000 සිට රු.21,340,000 දක්වා වූ ඇස්තමේන්තු 2015 වර්ෂයේදී ඉදිරිපත් කර තිබු නමුත් ඒසඳහා ඉදිරි ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොතිබුණි.

(ඇ) කසල ප්‍රතිචක්‍රියකරණ කාර්යය සඳහා අවශ්‍ය වන උපකරණ සභාවට ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

------------------------------

**නිශ්ක්‍රීය වත්කම්.**

--------------------

(අ) ප්‍රාදේශීය සභාවට අයත් එකතුව රු.1,619,850 ක්වූ වත්කම් ඒකක 06 ක් වසර 01 සිට වසර 03 ක් ඉක්මවූ කාලපරිච්ඡේදයක සිට නිශ්ක්‍රීයව පැවති අතර, යුධ හමුදා පරිහරණයේ තිබී සභාවට ආපසු භාර දී තිබුණු කැබ් රථයක් සහා භූමියේ ආවරණයක් රහිතව දිරාපත් වීමට භාජනය වෙමින් තිබුණි.

(ආ) පළාත් පාලන අමාත්‍යාංශයෙන් 2015 වර්ෂයේදී ප්‍රාදේශීය සභාවට ලබාදී තිබුණු රු.7,967,144 ක්වූ මාර්ග තලන යන්ත්‍රය ක්ෂේත්‍රයේ ප්‍රවාහනය සඳහා සුදුසු වාහනයක් සභාව සතු නොමැති වීම නිසා නිශ්කාර්යය වී තිබුණු අතර, 2016 මැයි 24 දිනට යන්ත්‍ර පැය 144 ක් පමණක් භාවිත කර තිබුණි.

**04. පද්ධති හා පාලනය**

------------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඉ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය.